**27-01-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සෑම පියවරකදීම ශ්‍රීමත් පිළිපදින්න. එසේ නැත්නම් මායා ඔබව බංකොලොත්භාවයට පත් කරාවි. ඔබගේ දෑස් ඔබව බොහෝ මුලා කරයි, එබැවින් ඔබ ඒවා ගැන බොහෝ ප්‍රවේසම් විය යුතුයි.

**ප්‍රශ්නය:** මායා, පාපයන් සිදු කරවන්නේ කුමන දරුවන් මඟින්ද? යාගයට බාධක වන්නේ, කුමන දරුවන්ද?

**පිළිතුර:** තමන්ගේම අහංකාරකම ඇති අය ලවා මායා බොහෝ පාපකර්ම සිදුකරවයි. එවන් ව්‍යාජ අහංකාරකමක් ඇති අය, මුරලියවත් හදාරන්නේ නැත. ඔවුන් ලවා එවන් වැරදීම් සිදු කරවීමෙන්, මායා ඔවුන්ගේ මුහුණට ගසා, ඔවුන්ව පැන්සයක් තරම්වත් නොවටිනා අය බවට පත්කරවයි. තම බුද්ධිය තුළ ඕපදූප සහ කුණු කන්දල් ඇති අය, යාගයේ බාධක බවට පත්වෙයි. එම පුරුදු ඉතාමත් නරකයි.

ඕම් ශාන්ති. ඔය දරුවන් අනිවාර්යයෙන්ම මෙහි අසුන්ගත යුත්තේ, ඒකායන කෙනා, පියා, ගුරුවරයා මෙන්ම පරම ගුරුය, යන සිතිවිල්ල ඇතිව බව, පරමාත්ම පියා, ඔය ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කර දී තිබේ. පියාව සිහිපත් කිරීමෙන් ඔබ පිවිතුරු වී, ඉන්පසුව පාරිශුද්ධ දේශයට යන බව ඔබට අවබෝධ වෙයි. ඔබ පිවිතුරු දේශයේ සිට පහළට පැමිණි බව, පරම පියා පහදා දී තිබේ. මුලදී ඔබ සතෝප්‍රධාන් වූ අතර ඉන්පසුව ඔබ සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්ව හරහා ගියහ. ඔබ වැටී ඇති බව ඔබට දැන් වැටහෙයි. ඔබ සංගම යුගයේ සිටින අතර, ඔබ අන් සෑම දේකින්ම ඉවතට පියවර තබා ඇති බවත්, ඔබ ශිව බාබාගේ සිහි කිරීමේ සිටියහොත්, ශිවාගේ දේශය වැඩි ඈතක නොවන බවත්, මෙම ඥානය තුළින් ඔබට වැටහෙයි. ඔබ ශිව බාබාව කොහෙත්ම සිහි නොකරන්නේ නම්, එවිට ශිවාගේ දේශය බොහෝ දුරය. එවිට දඬුවම් විඳීමට සිදුවන අතර, ඔබ බොහෝ දුරස්ථ වෙයි. පියා ඔය දරුවන්ට කිසිම අපහසුතාවයක් නොදෙයි. මුලින්ම ඔබගේ සිතිවිලි, වචන සහ ක්‍රියාවන්හි ඔබ පිවිතුරු විය යුතු බව, ඔහු ඔබට නැවත නැවතත් පවසයි. ඔය දෑස ඔබව බොහෝ සේ මුලා කරයි. ඔබ ගමන් කරන අතර ඔබ බොහෝ ප්‍රවේසම් විය යුතුයි. ධ්‍යානගත වීම සහ යෝගාව එකිනෙකින් සම්පූර්ණයෙන්ම වෙනස් බව, බාබා විස්තර කර තිබේ. යෝගා යනු සිහිකිරීමයි. ඔබගේ දෑස් විවරව තබා ඔබට සිහිකළ හැක. ධ්‍යානගත වීමට, යෝගා යැයි නොකියයි. කෙනෙක් ධ්‍යානගත වන විට, එයට ඥානය හෝ යෝගාව යැයි නොකියයි. ධ්‍යානගත වන අයට, මායා බොහෝ සේ පහර දෙයි. එබැවින් ඔබ එය ගැන බොහෝ ප්‍රවේසමින් සිටිය යුතුයි. පරමාත්ම පියාගේ සිහිපත් කිරීම බොහෝ ක්‍රමානුකූල විය යුතුයි. ඔබ නීතියට පටහැනි කුමන හෝ ක්‍රියා සිදුකරන්නේ නම්, මායා ඔබව පහළටම වට්ටයි. ධ්‍යානගත වීමට, ඔබ තුළ කිසි විටෙක ආශාවක් නොතිබිය යුතුයි. සියලුම ආශාවන්ගේ දැනුම පිළිබඳව සම්පූර්ණයෙන්ම නොදැනුවත් වන්න ඔබට කිසිම ආශාවක් නොතිබිය යුතුයි. ඔබ කිසිවක් නොඉල්ලාම, පියා ඔබගේ සියලු ආශාවන් ඉටුකරයි, නමුත් ඔබ ඔහුගේ උපදෙස් පිළිපැද්දොත් පමණයි. ඔබ ඔහුගේ උපදෙස් වලට අකීකරු වී, වැරදි මාර්ගයේ ගියහොත්, එවිට දෙව්ලොව යනවා වෙනුවට, ඔබ අපායට වැටීමට ඉඩ තිබේ. මෙසේ ගැයෙයි කිඹුලා, ඇතා ගිල දැමුවා. බොහෝ දෙනෙකුට ඥානය ලබා දුන් අය මෙන්ම භෝග් පූජා කළ අය, තව දුරටත් මෙහි නැත. ඔවුන් සියලුම නීති වලට අකීකරු වූ නිසා ඔවුන් පිටව ගොස්, සම්පූර්ණයෙන්ම මායාට අයත් විය. දේවතාවන් වන අතරතුර, ඔවුන් රකුසන් විය. මේ නිසයි ඔබ මෙම මාවතේ, බොහෝ ප්‍රවේසම් විය යුත්තේ ඔබ තමන්ව පාලනය කරගත යුතුයි. පරම පියා ඔය දරුවන්ට අනතුරු අඟවයි. ශ්‍රීමත් වලට අකීකරු නොවන්න. ඔබ පහළ බසින තත්ත්වයට ගියේ, රකුසු උපදෙස් පිළිපැදීම නිසාය. එතරම් උසස්ව සිටි ඔබ, දැන් පැමිණ සිටින්නේ කොහිද කියා බලන්න! ඔබ අන්ත පහළට පැමිණ ඇත! ඔබ දැන්වත් ශ්‍රීමත් අනුගමනය නොකර, නොසැලකිලිමත් වන්නේ නම්, ඔබගේ තත්ත්වය විනාශ වනු ඇත. බාබා ඊයේද විස්තර කළේ ඔබ ශ්‍රීමත් නොමැතිව යමක් කරන විට, බොහෝ සේ දුස්සේවය සිදුවෙයි. ඔබ ශ්‍රීමත් නොමැතිව යමක් කරන්නේ නම්, ඔබ දිගින් දිගටම පහතට වැටෙයි. ආරම්භයේ සිටම බාබා මව්වරුන්ව උපකරණ බවට පත් කළේ, කලස ලබා දෙන්නේ මව්වරුන්ට බැවින්. මෙසේ ගැයෙයි මව්වරුන්ට නමස්කාර වේවා! බාබා, මව්වරුන්ගේ කමිටුවක් ඇති කර, සෑම දෙයක්ම ඔවුන්ට භාර කළා. දියණියන් විශ්වාසවන්තයි. සාමාන්‍යයෙන් බංකොලොත් වන්නේ පිරිමින්ය. එබැවින් පියා කලස තබන්නේ මව්වරුන් මතයි. මෙම ඥාන මාවතේ, මව්වරුන්ද බංකොලොත් වෙයි. කෝටි ප්‍රකෝටි ගණනක් භාග්‍යවන්ත වීමට ඇති අය, මායාට පරාජය වී,

බංකොලොත් විය හැක. මෙහි, පිරිමි සහ ස්ත්‍රීන් යන දෙපිරිසම බංකොලොත් විය හැක. පිටත, බංකොලොත් වන්නේ පිරිමින් පමණයි. මෙහි කී දෙනෙක් පරාජය වී පිටව ගියාද කියා බලන්න. මින් කියැවෙන්නේ ඔවුන් බංකොලොත් වූ බවයි. භාරතයේ ජනයා සම්පූර්ණයෙන්ම බංකොලොත් වී ඇති බව, බාබා මෙහි අසුන් ගෙන විස්තර කරයි. මායා බොහෝ සේ බලවත්ය! ඔවුන් කවුරුන් වී සිටියාද එමෙන්ම ඔවුන් කොහි සිට සම්පූර්ණයෙන්ම වැටුණේද කියා ඔවුන්ට නොවැටහෙයි. මෙහිදීද, ඉහළට නඟින අතර, ඔවුන් ශ්‍රීමත් අමතක කර, තමන්ගේම උපදෙස් පිළිපැද, ඒ නිසා බංකොලොත් වෙයි. එබැවින් ඔවුන්ගේ තත්ත්වය කුමක් වෙයිද? පිටත, ඔවුන් බංකොලොත් වී, පසුව වසර 5 ක් හෝ 7 කට පසුව නැවත කි්‍රයාකාරී වෙයි. මෙහිදී, ඔවුන් උපත් 84කට බංකොලොත් වී, උසස් තත්ත්වයක් හිමි කරගැනීමට නොහැකි වෙයි ඔවුන් දිගින් දිගටම බංකොලොත් වෙයි. බොහෝ මහාරතීන් බොහෝ දෙනෙක්ව ඉහළ නැංවූ නමුත්, අද ඔවුන්ද මෙහි නැත ඔවුන් බංකොලොත් විය. මෙහි, තත්ත්වය බොහෝ සේ උසස්ය. කෙසේවෙතත්, ඔබ ප්‍රවේසම් නොවන්නේ නම්, ඔබට උපරිම ඉහළ සිට පහළටම වැටිය හැක. මායා ඔබව සම්පූර්ණයෙන්ම ගිලගනී. ඔය දරුවන් බොහෝ ප්‍රවේසම් විය යුතුයි. කමිටු පිහිටුවා, ඔබගේම උපදෙස් අනුගමනය කිරීමෙන් කිසි ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැත. ඔබගේ බුද්ධිය, පරමාත්ම පියා සමග යෝගාවේ සම්බන්ධ කරගන්න. මෙය කිරීමෙන් ඔබ සතෝප්‍රධාන් වෙයි. පියාට අයත් වීමෙන් පසුව, ඔබ පියා සමග යෝගාවේ නොසිට, ශ්‍රීමත් වලට අකීකරු වන්නේ නම්, ඔබ සම්පූර්ණයෙන්ම ඇද වැටෙයි. එවිට සම්බන්ධතාවය බිඳී යයි. සම්බන්ධය බිඳී ඇත්නම්, මායා ඔබට මෙතරම් කරදර කරන්නේ මන්ද කියා, ඔබ තමන්ව පරීක්ෂා කර බැලිය යුතුයි. ඔබ පියා සමග පූරුක සම්බන්ධ කිරීමට උත්සාහ දැරිය යුතුයි. ඔබගේ බැටරිය වෙන කොහොම චාජ් කර ගන්නද? ඔබ පාපකාරී කි්‍රයා සිදු කරන විට, බැටරිය බසියි. ඔබ ඉහළ නඟින අතර, පහළට ඇද වැටෙයි. එවැනි බොහෝ දෙනෙක් සිටින බව, බාබා දන්නවා. ආරම්භයේදී බොහෝ දෙනෙක් පැමිණ බාබාට අයත් විය. ඔවුන් බත්තිය තුළට පැමිණියා, නමුත් ඔවුන් අද කොහිද? ඔවුන් පැරණි ලෝකය සිහි කළ නිසා ඇද වැටුණා. පරම පියා පවසන්නේ අසීමිත නිරාශාව ඇති වීමට මං දැන් ඔබව දිරිගන්වනවා. මෙම පැරණි අපවිත්‍ර ලෝකයට ඔබගේ හදවත බැඳ නොගන්න. ඔබගේ හදවත දිව්‍යලෝකයට බැඳගන්න. මෙයට උත්සාහයක් අවශ්‍යයි. ඔබට ලක්ෂ්මී සහ නාරායන වීමට අවශ්‍ය නම්, යම් උත්සාහයක් දැරීමට අවශ්‍ය වෙයි! ඔබගේ බුද්ධියේ යෝගාව ඒකායන පියාට සම්බන්ධ විය යුතුයි. පැරණි ලෝකය පිළිබඳ නිරාශාවක් ඇති කරගන්න. ඔබ පැරණි ලෝකය අමතක කිරීම හොඳයි. කෙසේවෙතත්, ඔබ සිහි කළ යුත්තේ මොනවාද? සාම දේශය සහ සතුටෙහි දේශය. ඔබ ඇවිදින විට, අසුන් ගෙන සිටින විට සහ එහෙ මෙහෙ යන විට, හැකිතාක් පමණින් පියාව සිහි කරන්න. අසීමිත සතුටෙහි දෙව්ලොව සිහි කරන්න. මෙය ඉතා පහසුයි. ඔබ මෙම උපදෙස් දෙකට විරුද්ධ දිශාවට යන විට, ඔබගේ තත්ත්වය විනාශ වී යයි. ඔබ සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන බවට පරිවර්ථනය වීමටයි මෙහි පැමිණියේ. මෙය ආපසු ගමන බැවින්, ඔබ සෑම කෙනෙකුටම තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් විය යුතු බව පැවසෙයි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය නැවත සිදුවනවා යනු, දිව්‍යලෝකය, අපාය බවටත් ඉන්පසුව එම අපාය, දිව්‍යලෝකය බවටත් පරිවර්ථනය වන බවයි. මෙම චක්‍රය දිගින් දිගටම භ්‍රමණය වෙයි. ඔබට ස්ව-දර්ශන චක්‍රධාරීන් විලසින් මෙතැන අසුන් ගෙන සිටින්නට කියා, පියා පවසා තිබේ. මෙම ස්මරණයේ සිටින්න. අපි මෙම චක්‍රය වටා බොහෝ වාර ගණනක් ගොස් තිබේ. අපි ස්ව දර්ශන චක්‍රධාරීන්ය. අපි දැන් නැවතත් දේවතාවන් බවට පත්වනවා. ලෝකයේ කිසිම කෙනෙක් මෙම රහස නොදනී. දේවතාවන් මෙම ඥානයට සවන් දෙන්නේ නැත ඔවුන් ඒ වනවිටත් පාරිශුද්ධයි. ඔවුන්ට හක් ගෙඩිය පිඹීමට, එවන් ඥානයක් නොමැත. ඔවුන් ඒ වනවිටත් පිවිතුරු බැවින් මේ සඳහා සංකේතයක් ලබා දීමට අවශ්‍ය නැත. එම සංකේතය ලබා දෙන්නේ, දෙදෙනාගේ එකතුවෙන් අත් හතරේ ප්‍රතිරූව සෑදෙන විටයි. ඔබටද සංකේතය ලබා නොදෙන්නේ අද ඔබ දේවතාවන් වෙමින් සිටින නමුත්, හෙට දින ඔබ ඇද වැටෙයි මායා ඔබව වට්ටයි. පරමාත්ම පියා ඔබව දේවතාවන් බවට පත් කරවන අතර, මායා ඔබව රකුසන් බවට පත් කරවයි. මායා ඔබව බොහෝ ආකාර වලින් පරීක්ෂා කරයි. පියා සෑම දෙයක්ම විස්තර කරන විටයි, ඔබගේ ස්ප්‍රීතියෙන් ඔබ වැටී ඇති බව ඔබට අවබෝධ වන්නේ. බොහෝ දුප්පත් අසරණ ජීවාත්මයන්, ඔවුන්ට තිබුණු සෑම දෙයක්ම ශිව බාබාගේ නිධන් ගබඩාවේ එකතු කළ නමුත්, ඒ තිබියදී ඔවුන් විටෙක මායා අතින් පරාජය වූහ. ඔබ ශිව බාබාට අයත් වූ පසුව, ඔහුව අමතක කරන්නේ ඇයි? මෙහි ප්‍රධානතම දේ වන්නේ සිහිපත් කිරීමේ වන්දනා ගමනයි. ඔබට පිවිතුරු විය හැක්කේ යෝගාවේ සිටීමෙන් පමණයි. ඥානය සමගම, පාරිශුද්ධත්වයත් අවශ්‍යයි. ඔබ කන්නලව් කළේ බාබා, පැමිණ, අපට දිව්‍යලෝකයට යාමට හැකි වන සේ, අපව පිවිතුරු කරන්න! සිහිපත් කිරීමේ වන්දනා ගමන තිබෙන්නේ ඔබට පිවිතුරු වී උසස් තත්ත්වයක් හිමි කරගැනීමටයි. අතහැර පිටව ගිය අයත් අනිවාර්යෙන්ම ශිවාගේ දේශයට යනු ඇත, මන්ද, ඔවුන් තරමක ඥානය අසා ඇති බැවින්. ඔවුන් කුමන

ආකාරයේ තත්ත්වයක් හිමි කරගනීද යන්න, කම් නැත, නමුත් ඔවුන් අනිවාර්යෙන්ම පැමිණෙයි. ඔවුන් එක් වරක් හෝ පරමාත්ම පියාව සිහිකර ඇත්නම් ඔවුන් දෙව්ලොව යයි, නමුත් ඔවුන්ට උසස් තත්ත්වයක් හිමි වන්නේ නැත. දිව්‍යලෝකයේ නම ඇසීමෙන් පමණක් සතුටු නොවන්න. ඔබ අසමත් වූ පසු, පැන්ස කිහිපයක් පමණක් වටින තත්ත්වයකින් ඔබ සතුටු නොවිය යුතුයි. එය දිව්‍යලෝකය වන නමුත්, බොහෝ විවිධ මට්ටමේ තත්ත්ව තිබේ. ඔබ සේවකයෙක් හෝ පිරිසිදු කරන්නෙක් යන හැඟීම ඔබට තිබෙයි. අවසානයේදී ඔබ වීමට යන්නේ කවුරුන්ද කියා, ඔබට දර්ශන ලැබෙයි. මෙම තත්ත්වයට පත් වීමට, මා කුමන පාපයන් සිදුකළේද? මා අධිරාජවරියක් නොවූයේ ඇයි? ඔබ ගමන් කරන අතර, සෑම පියවරකදීම ප්‍රවේසම් වීමෙන්, ඔබට කෝටිපතියන් විය හැක. ඔබ ප්‍රවේසම් නොවන්නේ නම්, ඔබට කෝටිපතියන් විය නොහැක. දේවාලවල දේවතාවන් පෙන්වා ඇත්තේ, නෙළුම් මලක සංකේතය ඇතිවයි. ඔබට වෙනස වටහා ගත හැක. තත්ත්වයේ විශාල වෙනසක් තිබේ. දැන් වුවද, බලන්න තත්ත්වයේ කොතරම් විවිධ මට්ටම් තිබේද කියා. ඔවුන්ට බොහෝ ශෝභනයක් තිබේ. ඒ සෑම දෙයක්ම තාවකාලික සතුටයි. පරම පියා පවසන්නේ උසස් තත්ත්වයක් හිමිකරගැනීමට ඔබ සියලු දෙනාම අත් ඔසවයි. එබැවින් ඒ සඳහා අනිවාර්යෙන්ම උත්සාහ දැරිය යුතුයි. අත් ඔසවන ඇතැම් අය පවා කම්මුතු වී යයි. එවිට අන් අය විමසන්නේ මේ අය දේවතාවන් වීමට යනවාද? උත්සාහ දරන අතරතුර, ඔවුන් කම්මුතු විය! අත් එසවීම පහසුයි එමෙන්ම බොහෝ දෙනෙකුට විස්තර කිරීමත් පහසුයි. කෙසේවෙතත්, අන් අයට විස්තර කරන අතරතුර, සමහර මහාරතීන්ලාද අතුරුදහන් වෙයි. අන් අයට යහපතක් සිදුකරන අතර, ඔවුන් තමන්ට පාඩු කරගනී. මේ නිසයි පරම පියා පවසන්නේ බොහෝ ප්‍රවේසමින් සිටින්න. අභ්‍යන්තරගත වී පරම පියාව සිහි කරන්න. කෙසේද? බාබා, අපගේ පියා, ගුරුවරයා මෙන්ම සත්ගුරුය. අප අපගේ මිහිරි නිවහනට යනවා. ඔබ තුළ මේ සියලු ඥානය තිබිය යුතුයි. පියාට, දැනුම සහ යෝගාව යන දෙකම තිබෙන බැවින්, ඔබටත් මේ දෙකම තිබිය යුතුයි. ඔබට උගන්වන්නේ ශිව බාබා බව ඔබ දන්නවා. එබැවින් එය ඥානය මෙන්ම සිහිපත් කිරීමයි. ඥානය සහ යෝගාව යන දෙකම එකට තිබිය යුතුයි. ඔබ ශිව බාබාගේ සිහිපත් කිරීමේ පමණක් අසුන් ගත යුතු බවත් ඥානය ගැන අමතක කළ යුතු බවත් නොසිතන්න. පරම පියා ඔබට යෝගාව උගන්වන අතරතුර, ඔහු මෙම ඥානය අමතක කරනවාද? සියලුම ඥානය ඔබ තුළ රැඳී තිබෙයි. ඔය දරුවන්ට මෙම ඥානය තිබිය යුතුයි ඔබ එය හැදෑරිය යුතුයි. මා කුමන කිරියා සිදුකරන්නේද, මා දකින අන් අය, එම දේම සිදුකරයි. මා මුරලිය ඉගෙන ගන්නේ නැත්නම්, එවිට අන් අයද එය ඉගෙනගන්නේ නැත. මා පහළට ඇද වැටෙන්නේ නම්, අන් අයටද එය සිදුවී, අන් අයව වැට්ටීමට මා උපකරණයක් වනු ඇත. බොහෝ දරුවන් මුරලිය ඉගෙන ගන්නේ නැති අතර, ඔවුන්ට ව්‍යාජ අහංකාරකම තිබේ. මායා විගසින් ඔවුන්ට පහර දෙයි. සෑම පියවරකම ශ්‍රීමත් අවශ්‍යයි. එසේ නැත්නම් එක් හෝ තව පාපකර්මයක් සිදුවෙයි. බොහෝ දරුවන් බොහෝ වැරදීම් සිදුකරන අතර, එවිට සෑම දෙයක්ම විනාශ වෙයි. ඔබ වැරදීම් සිදු කරන විට, මායා ඔබගේ මුහුණට පහර දී, ඔබව පැන්සයක්වත් වටින්නේ නැති අයෙක් කරවයි. මේ සඳහා බොහෝ වැටහීම අවශ්‍යයි. ඔබ අහංකාර වන විට, මායා ඔබ ලවා බොහෝ වැරදි කිරියා සිදුකරවයි. ඔබ කමිටුවක් සාදන විට, කාන්තාවන් එක්කෙනෙක් හෝ දෙදෙනෙක් අනිවාර්යෙන්ම නායකත්වයේ සිටිය යුතුයි. ඔවුන්ගේ අවවාද වලින් සෑම දෙයක්ම සිදු කළ හැක. කලස ලබා දෙන්නේ ලක්ෂ්මීටයි. මෙසේ සිහි කෙරෙයි අමෘතය බෙදා දෙන විට, එය පානය කිරීමට, රකුසන් පවා පැමිණියා! යාගයේ බාධක ඇති කරන අය සිටියි. බොහෝ විවිධ බාධක සිදුකරන අය සිටියි. ඔවුන්ගේ බුද්ධිය තුළ, දවස පුරාම තිබෙන්නේ ඕපදූප පමණයි. එය ඉතාමත්ම නරකයි. සිදුවන සෑම දෙයක්ම පියාට වාර්තා කරන්න. ඔබව නිවැරදි කළ හැක්කේ පරම පියාට පමණයි. ඔබ තම අතට නීතිය නොගත යුතුයි. පරම පියාගේ සිහිපත් කිරීමේ සිට, සෑම කෙනෙකුටම ඔහුගේ හැඳින්වීම ලබා දෙන්න, එපමණයි. ඔබට ඔවුන් මෙන් වීමට හැකි වන්නේ එවිට පමණයි. මායා බොහෝ බලවත්ය. ඈය කිසිකෙනෙක් අත්නොහරියි. සෑම විටෙකම ඔබගේ පුවත් පියාට ලියන්න. අඛණ්ඩව ඔහුගෙන් උපදෙස් ලබාගන්න. ඔබට කොහොමත් සෑම දේකටම උපදෙස් ලැබෙයි. බාබා, යම් විශේෂිත කෙනෙක් ගැන යම් දෙයක් විස්තර කර ඇති නිසා, ඔහු අන්තර්යාමී (සෑම කෙනෙකුගේම ඇතුලාන්තය ගැන දන්න කෙනා) යයි ඔය දරුවන් සිතයි. කෙසේවෙතත්, පරම පියා පවසන්නේ නැත මා ඔබට ඥානය කියා දෙනවා. මෙහි අන්තර්යාමී වීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. ඔව්, ඔය සෑම කෙනෙක්ම මගේ දරුවෙක් බව මා දන්නවා. සෑම කෙනෙක් තුළම ඇති ජීවාත්මය, මගේ දරුවෙකි. පරමාත්ම පියා සෑම කෙනෙක් තුළම සිටිනවා නොවෙයි. මිනිසුන් මෙය වරදවා තේරුම් ගෙන තිබේ. පියා පවසන්නේ සෑම කෙනෙක්ම ජීවාත්මයක් බවත්, ඔහුගේ සිහසුන මත අසුන් ගෙන සිටින බවත් මා දන්නවා. මේවා බොහෝ පහසු කාරණාය! ඒ තිබියදී ඔවුන් මෙය අමතක කර, දෙවියන් සෑම තැනකම සිටින බව පවසයි. මෙම එක් වැරදීම නිසා, සෑම කෙනෙක්ම බොහෝ සේ පහළට වැටී ඇත! ඔබව ලෝකයේ අධිපතියන් බවට

පත් කරවන කෙනාට ඔබ අපහාස කරයි. මේ නිසයි පරමාත්ම පියා පවසන්නේ භාරතයේ අන්ත අධර්මිෂ්ඨකම ඇති විට, මා පැමිණෙන්නෙමි. පියා මෙහි පැමිණ ඇත. එබැවින් ඔය දරුවන් ඉතා හොඳින් ඥානයේ සාගරය මතගෑ යුතුයි. මෙම ඥානය ඉතා හොඳින් මතගෑමට කාලය සාදා ගන්න. එවිට පමණයි තමන්ට යහපතක් සිදුකරගැනීමට ඔබට හැකි වන්නේ. මෙහිදී එය මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි කිසි කෙනෙකුට සාගින්නේ මිය යැමට සිදුවන්නේ නැත. ඔබ සෑම කෙනෙක්ම, පියා සමග රැස් කරගන්නා ප්‍රමාණයට අනුව, ඔබ ඔබගේ භාග්‍යය නිර්මාණය කරගනී. ඥානය සහ භක්තියෙන් පසුව, නිරාශාව තිබෙන බව, පියා විස්තර කර තිබේ. නිරාශාව යනු, සෑම දෙයක්ම අමතක කිරීමයි. ඔබ තමන්ව නිදහස් කරගත යුතුයි: මෙම ජීවාත්මය වන මා, මෙම සිරුර හැර යමි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. තමන් මත විශාල පාලනයක් ඇති කරගන්න. ශ්‍රීමත් පිළිපැදීම ගැන කිසිම විටෙක නොසැලකිලිමත් නොවන්න. බොහෝ සේ ප්‍රවේසම් වන්න. කිසිම නීතියක් කඩ නොකරන්න.
2. අභ්‍යන්තරගත වී, ඔබගේ බුද්ධිය ඒකායන පියාට සම්බන්ධ කරන්න. මෙම පැරණි අපවිත්‍ර ලෝකය ගැන අසීමිත නිරාශාවක් ඇති කරගන්න. ඔබ සිදුකරන කුමන හෝ ක්‍රියාවක් දකින අන් අය, එම දේම සිදුකරනු ඇති බව, ඔබගේ බුද්ධියේ තබාගන්න.

**වරදානය:** ඔබ මෙම ඥාන කරුණු දිනපතා ආවර්ජනය කර, එමඟින් විසඳුම් වල ප්‍රතිමූර්ති සහ දුකෙන් තොර දේශයේ අධිරාජ්‍යයන් වේවා.
සෑම දිනකම, ඔබේ දිනපොත් වල සහ බුද්ධියේ ඇති මෙම ඥාන කරුණු ආවර්ජනය කර ඒවා ඔබේ ප්‍රායෝගික අත්දැකීම බවට පත් කර ගන්න. එවිට ඔබට ඕනෑම ආකාරයක ගැටළුවකට පහසුවෙන් විසඳුමක් සොයා ගැනීමට හැකි වනු ඇත. නිෂ්ඵල සිතිවිලි මිටියෙන් ගැටළු පර්වතය බිඳ දැමීමට උත්සාහ කිරීමෙන් ඔබේ කාලය නාස්ති නොකරන්න. "නාටකය" යන වචනය පිළිබඳ අවධානය තුළින් ඒවාට ඉහළින් පැන ඉදිරියට යන්න. එවිට එම පැරණි සංස්කාර ඔබේ සේවකයින් වනු ඇත, නමුත් ඔබ පළමුව ඔබේ සිංහාසනයේ අසුන්ගෙන සිටින අධිරාජ්‍යවරයෙකු විය යුතුය.

**පාඨය:** සෑමට ගෞරවය දීම යනු ගෞරවය ලැබීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

බන්ධන දිවියේ අත්දැකීම ලැබීමෙන් පමණයි ඔබට ජීවන මුක්තිය අත්විඳිය හැකි වන්නේ. එහිදී, ස්වර්ණමය යුගයේ දී, ජීවිතයේ බන්ධන පිළිබඳ ප්‍රශ්නයක් නොමැත. එහිදී ඔබ ඔබේ තිළිණයේ තත්ත්වයේ සිටිනවා ඇත. ඔබ දැන් අත්විඳින මුක්ති දේශයේ මුක්තිය අත්විඳීමට එහිදී ඔබට නොහැකිය. එමනිසා, මෙම සංගම යුගයේදී ඔබට මුක්තිය සහ ජීවන මුක්තිය අත්විඳිය හැකිය. ඔබ ඔබේ උරුමයට අයිතියක් ඉල්ලා ඇත, එබැවින් දැන්, එය ඔබේ ජීවිතයට ඇතුළත් කර එහි සම්පූර්ණ ප්‍රතිලාභය හිමි කර ගන්න.